•

# සිහි මූර්ඡා වූ රෝගියෙකු සඳහා පාරම්පරික ඖෂධ

පාරම්පරික වෛද්‍ය කේ.පී.ආර්. මුණසිංහ

විෂ චිකිත්සාව ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමය තුළ ප්‍රචලිත අංගයකි. මද විෂ සතුන් දෂ්ටයෙන් සිදුවන සුළු උපද්‍රව මෙන් ම විෂඝෝර සර්ප දෂ්ටයන් ගෙන් ඇතිවන බලවත් උපද්‍රව සඳහා ප්‍රතිකාර කිරීම දක්වා සාර්ථක හා අංග සම්පූර්ණ චිකිත්සාවක් දේශීය වෛද්‍ය ක්‍රමය සතු වේ.

මේ අතරින් විෂ අධික දෂ්ටයක දී ඇතිවන විෂ මූර්ඡා තත්ත්වයට ප්‍රතිකාර කිරීම විශේෂ චිකිත්සා ක්‍රමයකි. දෂ්ට විෂ අධික වීම ද, ප්‍රතිකාර ප්‍රමාද වීම ද විෂ මූර්ඡා වීමට හේතු වේ. මෙවැනි අවස්ථාවල දී විෂ වේග වැළැක්වීම හා රෝගියා මූර්ඡාවෙන් මුදවා ගැනීම සඳහා ශීඝ්‍ර ව ක්‍රියා කරන චිකිත්සා ක්‍රම යෙදිය යුතුය. එබැවින් එවැනි අවස්ථාවල දී චිකිත්සාව සඳහා යොදා ගන්නේ නස්‍ය කර්මයයි.

විෂ මූර්ඡා වූ රෝගියෙකුට චිකිත්සා කිරීමේ දී ගන්තලාව දොන් පේද්‍රික් විෂ වෛද්‍ය පරම්පරාව මගින් යොදා ගන්නා නස්‍ය වර්ග කිහිපයක් මෙසේය:

1. අමෘත අංජන ගුලියක් මුත්‍රාවලට දියකර නස්‍ය කිරීම.

2. ඉහත නස්නයෙන් ප්‍රතිඵල නොමැති විට අමු ඉඟුරු ස්වල්පයක්, ගම්මිරිස් ඇට 3ක් 4 ක්, තිප්පිලි කරල් 01ක්, තුඹගැට 01ක්, නික දළු ටිකක්, වතුර රහිත ව කොටා පිරිසිදු රෙදි කඩකට දමා ඉස්ම මිරිකා එක් නාස් පුඩුවකට බින්දු 2 බැගින් නස්න කිරීම.

අධික විෂ තත්ත්වයකදී විෂ මූර්ඡා වීම මෙන් ම, විෂ සන්නි තත්ත්වයක් ද ඇති විය හැකිය. වෙව්ලුම් සන්නිය, දොඩවන සන්නිය, ඇස් නාරින සන්නිය යනා දී වශයෙන් විෂ තත්ත්වයක දී ඇතිවිය හැකි සන්නි රෝග විවිධ වේ.

මෙම ඇස් නාරින සන්නිය අවස්ථාවේ දී ද, විෂ මූර්ඡාවේ දී මෙන් ශීඝ්‍ර ව ක්‍රියා කරන චිකිත්සා ක්‍රම යෙදිය යුතුය. ඒ සඳහා බහුල ව භාවිත වන්නේ අංජන යෙදීම හා නස්‍ය කර්මයයි. උදාහරණයක් ලෙස ඊස්වර ගුලි අංජනය යෙදීම. විනාඩි 7කින් පමණ ළපටි තැඹිලි - කුරුම්බා පොඩිකර (යුෂ මිරිකා) ඇස්වලට දැමීම දැක්විය හැකිය..